**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය**
**(නාරා ආයතනය)**

**තනතුරු පුරප්පාඩු**

ධීවර අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් පිළිබඳ විෂය සම්බන්ධයෙන් පර්යේෂණ සංවර්ධන හා කළමනාකරණ කටයුතු සිදුකරන හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම භාර ප්‍රධාන ජාතික ආයතනය වේ.

නාරා ආයතනයේ පහත සඳහන් පුරප්පාඩු වූ තනතුරු සඳහා අදාල සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයින්ට අවස්ථාව විවර වේ.

| අංකය | තනතුර හා පුරප්පාඩු ගණන | අදාල සුදුසුකම් |
|---|---|---|
| 01 | **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)**<br><br>**පුරප්පාඩු තනතුරු 10** | **බාහිර අයදුම්කරුවන් සඳහා**<br><br>**අධ්‍යාපන**<br><br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,<br>i සිංහල/දෙමළ<br>ii ගණිතය<br>iii ඉංග්‍රීසි<br>යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.<br><br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම<br><br>(ඇ) **අවශ්‍ය වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද**<br>පිළිගත් ආයතනයක පරිගණක භාවිතය පිළිබඳව හය මසකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br><br>**වයස**<br>අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.<br><br>**වැටුප් ක්‍රමය**<br><br>MA 1-2 (27,910 -10x300-7x350 – 12x600 – 12x710-49,080) |

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
IV. නාරා ආයතනයෙහි කාර්ය මණ්ඩලයට බලපාන පොදු නීතිවලට මෙම තනතුරු යටත් වේ.
V. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය නාරා ආයතනය සතුය.
VI. ඉහත තනතුරු සඳහා තේරී පත්වන්නන් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට හිමිකම් කියනු ඇත.

ඒ අනුව මාසික වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කළ යුතු වන අතර, නියෝජිතායතනය විසින් ස්වකීය සම්පත්වලින් වැටුපෙන් 15% ක් එම අරමුදලට දායක කරනු ඇත.

සේවක භාරකාර අරමුදලට දායක වශයෙන් වැටුපෙන් 3% ක් වන දායක මුදලක් නියෝජිතායතනය විසින් එම අරමුදලට දායක කරනු ඇත.

අධ්‍යාපන සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කරන සහතිකවල පිටපත්ද සමග ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද, සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයන්ද සහිතව සුදුසු අකෘතියක් අනුව පිළියෙල කරන ලද ජීව දත්ත ඇතුළත් අයදුම්පත්‍රය 2020 දෙසැම්බර් මස 15 දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපැල මගින් (humanresourcenara@gmail.com) යොමු කළ යුතුය.

අයදුම්කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය**
**කාක දූපත,**
**මට්ටක්කුලිය,**
**කොළඹ 15**
011-2521000 / 2521006
(www.nara.ac.lk)